**ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය - 2019**

---------------------------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

---------------

**1.1 තත්ත්වාගණනය කළ මතය**

---------------------------

ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ආයතනයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-----------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

--------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනයේ ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ප්‍රකාරව වත්කම් සහ වගකීම් එකිනෙකට හිලව් නොකළ යුතු වුව ද, මුදල් ශේෂයෙන් රු. 1,904,453 ක බැංකු අයිරාව හිලව් කර දක්වා තිබුණි. | එකග වේ. පෙර වර්ෂ ගැළපීම් ලෙස 2020 මූල්‍ය ප්‍රකාශන වල නිවැරදි කිරීම් සිදු කරනු ලැබේ. | ප්‍රමිත අංක 01 ප්‍රකාරව වත්කම් සහ වගකීම් එකිනෙකට හිලව් නොකළ යුතු වීම. |
| (ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 ට පටහැනිව, පාරිතෝෂික ගෙවීම් රු.905,940 ක් මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ ලෙස හඳුනා ගැනීම වෙනුවට, ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහ ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා තිබුණු අතර | එකග වේ. පෙර වර්ෂ ගැළපීම් ලෙස 2020 මූල්‍ය ප්‍රකාශන වල නිවැරදි කිරීම් සිදු කරනු ලැබේ. | ප්‍රමිත අංක 02 ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළයුතු වීම. |

| | | |
|---|---|---|
| ආයෝජන පොළී ආදායම රු. 61,430,740 ක් ආයෝජන ක්‍රියාකාරකම්වලින් වූ මුදල් ප්‍රවාහ යටතේ වෙන්ව දක්වනවා වෙනුවට ආයෝජන මුදල් ප්‍රවාහ සමග එකතු කර දක්වා තිබුණි. | | |
| (ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ප්‍රකාරව වත්කම් පන්තියකට අයත් එක් වත්කමක ප්‍රත්‍යාගණිත අගය වැඩිවීම හෝ අඩුවීම,වෙනත් වත්කම් පන්තීන්හි අගයට හිලව් නොකළ යුතු වුවද දුරකතන සවි කිරීම්, වැද්දුම් හා සවිකිරීම් සහ කාර්යාල උපකරණවලට අදාලව එකතුව රු.11,424,009 ක ප්‍රත්‍යාගණන ඌණතාවය අදාල වත්කම් පන්තිය නොසලකා හරිමින් හිලව් කර තිබුණි. | එකග වේ. පෙර වර්ෂ ගැළපීම් ලෙස 2020 මූල්‍ය ප්‍රකාශන වල නිවැරදි කිරීම් සිදු කරනු ලැබේ. | ප්‍රමිත අංක 07 ප්‍රකාරව වත්කම් පන්තියකට අයත් එක් වත්කමක ප්‍රත්‍යාගණිත අගය වැඩිවීම හෝ අඩුවීම,වෙනත් වත්කම් පන්තීන්හි අගයට හිලව් නොකළ යුතු වීම. |
| (ඈ)ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 19 ප්‍රකාරව නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වල (වත්කම්) ශුද්ධ අගය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ හෙළිදරව්කළ යුතු වුවද , රු.15,637,414 ක් වූ පාරිතෝෂිත ආයෝජන සහ පාරිතෝෂිත සඳහා වෙන් කිරීම රු.39,776,194 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වෙන්ව දක්වා තිබුණි. ඒ අනුව ආයතනයේ ශුද්ධ නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් රු.24,138,780ක් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් නොවුණි. | එකග වේ. පෙර වර්ෂ ගැළපීම් ලෙස 2020 මූල්‍ය ප්‍රකාශන වල නිවැරදි කිරීම් සිදු කරනු ලැබේ. | ප්‍රමිත අංක 19 ප්‍රකාරව නිශ්චිත ප්‍රතිලාභ බැඳීම්වල (වත්කම්) ශුද්ධ අගය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ හෙළිදරව්කළ යුතු වීම. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2014 වර්ෂයේදී සංචාරක පොලිස් ඒකකයෙන් ලැබිය යුතු කුලී ආදායම ලෙස ගිණුම්ගත කල රු. 3,192,000 ක මුදල නොලැබෙන බවට තහවුරු වී තිබුණ ද, 2019 දෙසැම්බර් 31 දින වන විටත් ඒ සඳහා අවශ්‍ය ගැලපීම් මූල්‍ය ප්‍රකාශනවල සිදු කර නොතිබුණි. | එකග වේ. කළමනාකරණ මණ්ඩලයට දැනුවත් කර කැමැත්ත ලබාගෙන මූල්‍ය ප්‍රකාශන වල 2021 දී ගලපනු ඇත. | නොලැබෙන ආදායම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැලපීම් සිදු කළයුතුවීම. |

### 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු. | වෙනස රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- | --- |
| (අ)ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියෙන් ලැබිය යුතු ගිණුම් | 3,267,191 | 6,512,810 | 3,245,619 | මෙම ආයතනික ශේෂයන් වර්තමානයේදී සසඳමින් පවතින අතර 2021 දී මෙම ගැටලුව විසඳීමට කටයුතු කරනු ඇත. | වැඩිදුර පරීක්ෂාකර අවශ්‍ය ගැලපීම් කිරීමට කටයුතු කිරීම. |
| (ආ)ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු ගිණුම් | 0 | 8,653,724 | 8,653,724 | මෙම ආයතනික ශේෂයන් වර්තමානයේදී සසඳමින් පවතින අතර 2021 දී මෙම ගැටලුව විසඳීමට කටයුතු කරනු ඇත. | වැඩිදුර පරීක්ෂාකර අවශ්‍ය ගැලපීම් කිරීමට කටයුතු කිරීම. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1. ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2019 දෙසැම්බර් 31 දිනට වෙළඳ ණයගැතියන්ගේ වටිනාකම රු.26,244,031 ක් විය. කෙසේ වුවද , 2021 ජනවාරි 31 දින වන විට ද කිසිදු ණයගැතියෙක්ගෙන් ශේෂ තහවුරු කිරීමක් ලැබී නොතිබූ අතර ණයගැතියන් සඳහා අඩමාන ණය ප්‍රතිපත්තියක් හඳුන්වා දී නොතිබුණි. තවද 2019 දෙසැම්බර් 31 දිනට ණයගැති වටිනාකමෙන් එකතුව රු.13,949,000 ක් වසර 05කට වඩා වැඩි කාලයක සිට හිඟව පැවති අතර එය මුළු ණයගැතියන්ගෙන් සියයට 53 ක් විය. ඒ අතුරින් අයකර ගැනීමේ කටයුතු සඳහා, එක් ණයගැතියෙකුගෙන් අය විය යුතු රු.4,068,000ක වටිනාකම සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර තිබුණි. | එකග වේ. දීර්ඝ කාලීන හිග හිටි ශේෂ පරීක්ෂාවට කමිටුවක් පත් කරන ලද අතර කළමනාකරණ මණ්ඩලය මාසිකව ප්‍රගතිය පරීක්ෂා කරනු ලැබේ. ඉන් දිගු කාලීනව හිගව පැවති රු. 5,140,571 ක ශේෂය ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයට අදාළ වන අතර රු, 1,118,000 ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තුමේන්තුවට අදාළ වේ. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සහ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යංශයට අදාළ වටිනාකම් සැසඳුම් ක්‍රියාවලියෙන් නිවැරදි කරනු ඇත. මුලු හිගයෙන් පෙර අමාත්‍යවරයාගේ කාර්යාලයට අදාළව ආසන්න වර්ෂයේ රු.මිලියන 1.4ක් වන අතර අප මේ වන විටත් සංචාරක අමාත්‍යවරයාට වටිනාකම අයකර ගැනීම පිළිබඳව ලියා ඇත. 2021 දී මෙම ගැටලු විසඳීමට ක්‍රියාමාර්ග ගනු ඇත. | අඩමාන ණය ප්‍රතිපත්තියක් හඳුන්වා දියයුතු වීම සහ ණයගැති ශේෂ අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගැනීම. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ)2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 39(1) උපවගන්තිය | අමාත්‍යවරයා විමසා ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයක් පත්කිරීමට 2021 ජනවාරි 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | අමාත්‍යවරයා විමසා ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයක් පත්කිරීමට කටයුතු කිරීම. |

| | | | |
|---|---|---|---|
| (ආ)2003 ජුනි 02 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක පීඒඩී/12<br>--------------------- | | | |
| (i) 6.5.1 වගන්තිය | ගිණුම් වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, 2019 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන දින 306 ක ප්‍රමාදයකින් යුක්තව 2021 ජනවාරි 01 දින ඉදිරිපත් කර තිබුණි | පිළිතුරු ලබා දී නොමැත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුවීම. |
| (ii) 6.5.3 වගන්තිය | 2015 සිට 2018 වර්ෂය දක්වා වූ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට ආයතනය 2021 ජනවාරි 31 දින වන විටත් පියවර ගෙන නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුවීම. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>-------------------<br>මුදල් රෙගුලාසි 371(2)(ආ) | | | |
| | තත්කාර්ය අතුරු අග්‍රිමය එය ලබා දුන් කාර්යය අවසන් කළ වහාම පියවිය යුතු වුවද, අවස්ථා 54කදී ලබා දී තිබුණු රු.2,100 ක සිට රු. 500,000ක් දක්වා වූ පරාසයක තත්කාර්ය අතුරු අග්‍රිමය පියවීම සඳහා දින 16 ක සිට දින 467ක් දක්වා වූ කාල පරාසයක් ගතකර තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | තත්කාර්ය අතුරු අග්‍රිමය එය ලබා දුන් කාර්යය අවසන් කළ වහාම පියවිය යුතුවීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.1,983,966 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 150,814,061 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 152,798,027 ක පිරිහීමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ සංචාරක සංවර්ධන බදු සහ අපගමන බදු ආදායම් අඩු වීම මෙන්ම වියදම් ඉහළ යාමද මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 දී තොරතුරු පද්ධතියක් සංවර්ධනය කිරීමට රු.3,771,216 ක වියදමක් දරා තිබුණ ද, ආයතනයේ අවශ්‍යතාවයන් සමග නොගැළපීම හේතුවෙන් ක්‍රියාත්මක කිරීමේදී එය අසාර්ථක වී තිබුණි. එසේ වුවද විගණිත දිනය දක්වාම එය නිවැරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | රු.2,262,730 ක් පමණක් මෘදුකාංග පද්ධතිය ගෙවා ඇත. ඉතිරිය රු. 1,508,486 ක් 2009.12.31 දිනට ගෙවිය යුතු ලෙස පෙන්වා ඇත. වගකීම් යටතේ පෙන්වා ඇති වටිනාකම 2020 මූල්‍ය ප්‍රකාශන වල ගලපනු ඇත. ආයතනය 2021 දී මෙම ගැටලු විසදීමට අවශ්‍ය පියවර ගනු ඇත. | ආයතනයේ අවශ්‍යතාවයන් සමග ගැලපෙන පරිදි පද්ධති සංවර්ධනය කිරීමට කටයුතු කළයුතුවීම. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2011 දී අමාත්‍යාංශයකින් ලැබී තිබූ වාහනයක අයිතිය පවරා ගැනීමට 2021 ජනවාරි 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | එකග වේ. | වාහනයේ අයිතිය පවරා ගැනීමට කටයුතු කළයුතු වීම. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය තුළදී සමුද්‍රා හෝටලයේ ආදායම් ලබා ගැනීම සඳහා හෝටල් රාත්‍රී කාමර 2,555ක් තිබුණ ද, උපයෝජනය කර ගෙන තිබුණේ රාත්‍රී කාමර 479 ක් පමණක් හෙවත් සියයට 19 ක් පමණි. | එකග වේ. | කාමර උපරිම ධාරිතාවයෙන් උපයෝජනය කිරීමට කටයුතු කළයුතු වීම. |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අනුමත සේවක සංඛ්‍යාව 217 ක් වූ අතර තත්‍ය සේවක සංඛ්‍යාව 193 ක් විය. ඒ අනුව, තනතුරු 24 ක් පුරප්පාඩුව පැවතුණි. ඉන් ප්‍රධාන තනතුරු වන නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (අනධ්‍යයන), අධ්‍යක්ෂ (වෙළඳ), ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුරු 05 ක් සහ සහකාර කථිකාචාර්ය තනතුරක පුරප්පාඩු පිරවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | එකග වේ. | පුරප්පාඩු වී ඇති තනතුරු පිරවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතුවීම. |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

-------------------------------------------

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

--------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2019 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මට අනුව රු. මිලියන 06 ක් වෙන් කර තිබූ ක්‍රියාකාරකම් 03ක් ක්‍රියාත්මක කර නොතිබූ අතර,සැලැස්මේ දක්වා තිබුණු ක්‍රියාකාරකම් 10 ක් සඳහා වර්ෂය තුළදී සියයට 50 කටත් වඩා අඩුවෙන් අරමුදල් උපයෝජනය කර තිබුණි. | එකඟ වේ. | ක්‍රියාකාරී සැලැස්ම වඩා සාර්ථක කරගැනීමට කටයුතු කළයුතුවීම. |